# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1982/32 - 2016 සැප්තැම්බර් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2016.09.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : ඩීඑස්-ඩබ්ලිව්ඩී/එල්එන්ඩී/1/3/14/50(2011/24).

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* :
එල්ඩී/05/2005/එච්ඩබ්ලිව්/එස්ටීඩීපී/ජීඩීබී/605.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර*:

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිවිටිය ගමේ, අංක. 193ඊ, නුගේතොට ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් ගාල්ල දිස්ත්‍රික් ජ්‍යෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් 2014.03.05 දිනැතිව පිළියෙල කරන ලද මූලික පිඹුරු අංකය. ගා4066 පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0147 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස (01):

01. **කැබලි අංක. 1**

ඉඩමේ නම: අතපත්තුගෙවත්ත; ඉඩමේ විස්තරය: තේ වගාව, අවුරුදු 12 ක් පමණ වයසැති තේ පඳුරු 140 ක් පමණ ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: කේ. එම්. පී. උමාවතී, සැවැන්න වේල්ල අසළ, නුගේතොට; ප්‍රමාණය: හෙක්. 0.0147.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2016 සැප්තැම්බර් මස 26 වන දින අනුව පෙරවරු 9.30 ට වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2016 සැප්තැම්බර් මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඒ. එම්. ඒ. යූ. ජී. කාරියවසම්,
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරී,
වැලිවිටිය - දිවිතුර.

2016 අගෝස්තු මස 25 වැනි දින,
වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

09 - 669